**UNIVERSITY OF PERADENIYA**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - නව නිර්දේශය) පරීක්ෂණය 300 මට්ටම - 2023**
**இளங்கலைமாணிப் பட்ட பரீட்சை (வெளிவாரி-புதிய பாடத்திட்டம்) 300 வது தேர்ச்சி மட்டம் 2023**

**Bachelor of Arts (External-New Syllabus) Examination 300 Level - 2023**

# ECNE 301 – ශ්‍රී ලංකා ආර්ථිකය

**උපදෙස්:**

1. මෙම ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න **06ක්** ඇතුළත් වේ. **ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**
2. අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.
3. කාලය : පැය තුනක් (03) පමණි.

---

1. (i). "පශ්චාත් නිදහස් සමයේදී කෘෂිකාර්මික අංශය මුහුණ දී ඇති ප්‍රධානතම ගැටළුවක් වන්නේ රාජ්‍ය අංශය මත අධික ලෙස රඳා පැවතීමයි". සාකච්ඡා කරන්න. (ලකුණු 10)

   (ii). ශ්‍රී ලංකාවේ සේවා අංශයේ ප්‍රධාන ගැටළු සහ අපේක්ෂාවන් සඳහන් කරන්න. (ලකුණු 10)

2. (i). පහත සඳහන් ප්‍රකාශය විවේචනාත්මකව අගය කරන්න: "කලාපයේ ඇති අනෙකුත් අසල්වාසී රටවල් සමග සසඳන විට ශ්‍රී ලංකාව විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමේදී දුර්වල ලෙස ක්‍රියා කර ඇත". (ලකුණු 12)

   (ii). රටතුළට විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමේදී යොදාගත හැකි ප්‍රතිපත්තිමය නිර්දේශයන් යෝජනා කරන්න. (ලකුණු 08)

3. (i). පසුගිය වසර 25ක කාලය තුළදී ශ්‍රී ලංකාවේ කාර්මික අංශයේ ප්‍රධාන සංයුතිය දළ වශයෙන් සටහන් කරන්න. (ලකුණු 05)

   (ii). පහත සඳහන් ප්‍රකාශය විවේචනාත්මකව විභාග කරන්න: "1977න් පසුකාලීන ආර්ථික ප්‍රතිසංස්කරණයන් ශ්‍රී ලංකාවේ කාර්මික අංශයේ කැපී පෙනෙන සංවර්ධනයක් ඇති කොට නැත". (ලකුණු 15)

4. (i). 1977න් පසු ආරම්භ වූ ආර්ථික ලිබරල්කරණ ප්‍රතිසංස්කරණවලින් පසු ඇතිවූ අපනයන විවිධාංගීකරණය සඳහා සාක්ෂි මොනවාද? (ලකුණු 07)

   (ii). 1977න් පසු ආනයන ව්‍යුහය කෙසේ වෙනස් වී තිබේද? ඊට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii). "1978 ආර්ථික ලිබරල්කරණ ප්‍රතිසංස්කරණවලින් පසුව ශ්‍රී ලංකාවේ වෙළෙඳ හිඟය අඩු වී ඇත". සත්‍යවේ ද/අසත්‍ය වේ ද? යෝග්‍ය සාක්ෂි සපයමින් ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 08)

5. (i). "ශ්‍රී ලංකාවේ ඉහළ සුබසාධන වියදම්වල ප්‍රතිවිපාක මානව සංවර්ධන දර්ශකයේ ඉහළ වාර්තා මගින් ප්‍රතිමූර්තිමත් වේ". ඔබ එකඟ වේද? එසේ එකඟ වන්නේ මන්ද?/ එකඟ නොවන්නේ මන්ද? යෝග්‍ය සාක්ෂි සපයමින් ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 10)

(ii). "පෞද්ගලීකරණ ප්‍රතිසංස්කරණ හරහා දැනට පවතින රජය සතු ව්‍යවසායන් මූල්‍ය බරක සිට වටිනාකම් නිර්මානය කරන්නන් දක්වා පරිවර්තනය කිරීම, ශ්‍රී ලංකාවේ දිගු කාලීන සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා පහසුකම් සපයන්නන් ලෙස ඒවා ක්‍රියාත්මක වීමේදී වැදගත් වේ". සාකච්ඡා කරන්න. (ලකුණු 10)

6. (i). ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික අර්බුදයේ මූල හේතුන් නිර්ණය කරන්න. (ලකුණු 10)

(ii). ශ්‍රී ලංකාවේ වර්තමාන විදේශ විනිමය අනුපාත අර්බුදය මැඩපවත්වා ගැනීමට යොදාගත හැකි විසඳුම් සඳහන් කරන්න. (ලකුණු 10)

********************************